# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 අගෝස්තු

සමාජීය විද්‍යා පීඨය

සංවර්ධන අධ්‍යයන

**සංවර්ධන අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේද - DVST 28224**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. පර්යේෂණ මගින් සංවර්ධනය වේගවත් කලහැකි අයුරු උචිත නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

02. ව්‍යවහාරික පර්යේෂණ (Applied Research) හඳුන්වා, සංවර්ධන අධ්‍යයන පර්යේෂණ සඳහා එම පර්යේෂණ වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 20)

03. ''පර්යේෂණයක අත්‍යවශ්‍යම මූලිකාංගයක් වන්නේ පර්යේෂණ ගැටලුවයි.'' යථෝක්ත ප්‍රකාශය සහේතුකව විග්‍රහ කරන්න. (ලකුණු 20)

04. පර්යේෂණ ක්‍රියාවලිය සාර්ථක කරගැනීමට ''සාහිත්‍ය විමර්ශනය'' (Literature Review) වැදගත් වන අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 20)

05. අ) ප්‍රමාණාත්මක පර්යේෂණ හඳුන්වන්න. (ලකුණු 04)

ආ) ප්‍රමාණාත්මක පර්යේෂණ සඳහා භාවිතා කළ හැකි නියැදි ක්‍රම දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

ඇ) ඉහත 5 (ආ) හි දක්වන ලද නියැදි ක්‍රමවල වාසි සහ අවාසි දෙක (02) බැගින් දක්වන්න. (ලකුණු 08)

06. ආ) ප්‍රජා මූලික පර්යේෂණ හඳුන්වන්න. (ලකුණු 04)

අ) ප්‍රජා මූලික පර්යේෂණ සඳහා ''සහභාගීත්ව'' මූලධර්මය උපයුක්ත කරගැනීමේ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 16)

07. ''වත්මන් ආර්ථික අර්බුදය දිළිඳු ප්‍රජාවගේ ආහාර සුරක්ෂිතතාව කෙරෙහි ඇතිකර ඇති බලපෑම'' යන මැයෙන් සිදුකෙරෙන පර්යේෂණයකට අදාළව දත්ත රැස්කිරීම සඳහා යෝග්‍ය ප්‍රශ්නාවලියක් සකස් කරන්න. (ලකුණු 20)

08. පහත මාතෘකා අතුරින් දෙකකට (02) සංක්ෂිප්ත සටහන් සපයන්න.

අ) පර්යේෂණ පරතරය (Research Gap)

ආ) විනිශ්චය නියැදීම (Judgemental Sampling)

ඇ) කාර්යබද්ධ පර්යේෂණ (Action Research)

ඈ) සම්මුඛ සාකච්ඡා (Interviews)

(ලකුණු 10 x 2 = 20)

**********************************